www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඕස්ට්‍රේලියානු මැතිවරනයෙන් පසු: කම්කරු පන්තිය සඳහා ඉදිරි මාවත

## After the Australian election: The way forward for the working class

**2010 අගෝස්තු 24**

අගෝස්තු 21 දින මැතිවරනයෙන් බිහිවූ අඩමාන පාර්ලිමේන්තුව ඕස්ට්‍රේලියාවේ ද ජාත්‍යන්තරව ද පාර්ලිමේන්තු ක්‍රමයේ ගැඹුරුවන අර්බුදයේ වැඩිදුර ප්‍රකාශනයකි.

1931 පටන් පලමු ආන්ඩුව දෙවන වතාවටත් බලයට පත්ව නැති අතර 1940 පටන් අඩමාන පාර්ලිමේන්තුවක් තිබී නැත. මෙම සිදුවීම් හටගත්තේ පිලිවෙලින් මහා අවපාතයේ ගැඹුරුම අවස්ථාවේදී හා දෙවන ලෝක යුද්ධයේ ආරම්භක අවධියේ ය යන්න වර්තමාන ප්‍රතිඵලයට යටින් දිවෙන ආර්ථික හා දේශපාලන ආතතීන්ගේ තීව්‍රතාවය ඉස්මතු කර පෙන්වයි.

ප්‍රතිඵලය දේශපාලන සංස්ථාපිතය සොලවා දමා ඇත. "මෙම මැතිවරනය ෆෙඩරේෂනය පිහිට වූ දා පටන් ජාතියට සේවය කර තිබෙන ප්‍රමුඛ ද්වි-පක්ෂ ක්‍රමයට දරුනු තිගැස්මක් අත්කරදී තිබේ" යයි ද ඕස්ට්‍රේලියන් පුවත් පතේ කතුවැකියක් ප්‍රකාශ කලේ ය. තවත් වාර්තාවකට අනුව මෙම ප්‍රතිඵලය "දෙවන ලෝක යුද්ධයේ පටන් ඕස්ට්‍රේලියානු දේශපාලනය මත ආධිපත්‍යය දැරූ ස්වයං-තෘප්ත ද්වි-පක්ෂ ක්‍රමයේ විනාශය නිවේදනය කලේ ය." මෙ මගින් අවධාරනය කරන්නේ සුවිශේෂතාවේ මිථ්‍යාවට විපරීතව කිසිදු රටක් ගෝලීය ආර්ථික හා දේශපාලන කුනාටුවට වැඩිදුර සංවේදී නැති බව යි. බ්‍රිතාන්‍ය මැතිවරනයෙන් අඩමාන පාර්ලිමේන්තුවක් බලයට පත්වී මාස හතරකටත් අඩුකාලයක් තුල ඕස්ට්‍රේලියාවේ ද එයම සිදු වී තිබේ. එසේ ම කැනඩාවේ ද පසුගිය මැතිවරන තුන, සුලුතර ආන්ඩු බිහිකර ඇත්තේ පාර්ලිමේන්තුව වැසී ගිය දේශපාලන අර්බුද නිර්මානය කරමිනි.

මාස දෙකකට පෙර ලේබර් අගමැති කෙවින් රඩ් බලයෙන් පහකල දේශපාලන කුමන්ත්‍රනය, ඊනියා පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ මුහුනතට පිටුපසින් සැබෑ බලය අභිබවා ක්‍රියාත්මක වන බලවේග පිලිබඳව ඇඟවුම් සහිත ආලෝකයක් හෙලී ය. රාජ්‍ය යාන්ත්‍රනය ද සමගින් එම සංගත හා මූල්‍ය ප්‍රභූ තන්ත්‍රයන්ම ඊලඟ ආන්ඩුවේ සංයුතිය හා න්‍යාය පත්‍රය තීරනය කරනු ඇත.

පාලක පන්තිය සම්බන්ධයෙන් ගත්කල, ස්ථාවර ආන්ඩුවක් පිහිටුවීමට ප්‍රධාන පක්ෂ දෙක ම අසමත් වීම, ගැඹුරුවන ගෝලීය ආර්ථික අර්බුදයේ හා ඉහල යන භූ-දේශපාලනික ආතතීන්ගේ කොන්දේසි යටතේ පාර්ලිමේන්තු යාන්ත්‍රනයන් වඩ වඩාත් අයථාර්ථවත් බවට පත්වෙමින් තිබේ ය යන්න අර්ථවත් කරයි. "සභාගයේ ටෝනි ඇබෝ හෝ ලේබර් පක්ෂයේ ජූලියා ගිලාඩ් යන කවුරුන් නායකත්වය දුන්න ද මෙය වනාහි, තවත් ගෝලීය අවපාතයකට, ස්වාභාවික සම්පත් වෙලඳපොල උත්පාතයේ අවසානයට හා පරිනතභාවයට පත් ජනගහනයේ අභියෝගවලට එරෙහිව ස්ථාවර ආන්ඩුවක් හා ඕස්ට්‍රේලියානු ආර්ථිකය ශක්තිමත් කිරීමට අවශ්‍ය ජනප්‍රිය නො වන ආර්ථික ප්‍රතිසංස්කරන සඳහා ඇතිවිය හැකි නරක ම ප්‍රතිඵලය යි" යනුවෙන් ද ඕස්ට්‍රේලියන් ෆයිනෑන්ෂල් රිව්ව් පත්‍රය ප්‍රකාශ කලේ ය.

ස්වාධීන මන්ත්‍රීවරුන් තිදෙනා සමග පවත්වන සාකච්ඡාවලින් කුමන ආන්ඩුවක් බිහි වුවත් "බැරෑරුම් ආර්ථික ප්‍රතිසංස්කරන න්‍යාය පත්‍රයක් යලි ඉස්මතු වීමට එම සංයෝගයන් එකක්වත් හොඳ පෙර නිමිති පල නො කරන" බව හා "ජාත්‍යන්තර ආයෝජකයින් අතර ඕස්ට්‍රේලියාව පිලිබඳව පවතින කීර්තිනාමයට උපකාරී නො වන" අවිනිශ්චිතතාවක් නිර්මානය කරමින "ප්‍රතිසංස්කරන පක්ෂාඝාත වීමේ" අන්තරායක් පවතින බවට පුවත්පත අනතුරු ඇඟවීය.

"ඊ ලඟ අගමැතිවරයාගේ ප්‍රමුඛ කර්තව්‍යයන්ගෙන් එකක් වන්නේ ආන්ඩුව ස්ථාවර භාවයට, මූල්‍ය විනයට හා ප්‍රතිසංස්කරනයට කැප වී සිටින බව සෙසු ලෝකයාට යලි සහතික කිරීම යි. ආන්ඩුවේ අනාගත සංයුතිය අනුව මෙය පහසු නො වන නමුත් එය කලයුතු ව ඇතැයි" පුවත්පත කියා

සිටී.

වෙනත් වචනවලින් කිවහොත් ප්‍රමුඛ කාරනය වන්නේ ඡන්ද දායකයන්ගේ අවශ්‍යතා හා අභිලාෂයන් ඉෂ්ට කිරීම නොව, ලෝකය පුරා ආන්ඩු සමග එක පෙලට සිටිමින් වියදම් කප්පාදුවේ "ප්‍රතිසංස්කරන" න්‍යාය පත්‍රයක් හා කම්කරු පන්තියේ සමාජ තත්වයට පහර එල්ල කරමින් ජාත්‍යන්තර මූල්‍ය වෙලඳපොලවල්වල විශ්වාසය රඳවා ගැනීම යි.

ඒ සමග ම, පාලනය කිරීමට අවශ්‍ය වරපත්‍රය, "ජාතික අවශ්‍යතාව කැප නො කර ස්ථාවර භාවය පිලිබඳ හොඳ ම බලාපොරොත්තුව දල්වන පක්ෂයට හිමිවේ" යයි ද ඕස්ට්‍රේලියන් පත්‍රය සඳහන් කලේ ය. සම්මුතීන්, "අවම වසයෙන් කෙටිකාලීනව හෝ ප්‍රතිසංස්කරනවලින් ඈත්ව සිටින කාලය දිග් ගස්සනු ඇති අතර නව මැතිවරනයකින් වඩාත් හොඳ ප්‍රතිඵලයක් ලබාදෙන තෙක් පිලිවෙත විය යුත්තේ සහයෝගය හා සංහිඳියාව යි."

එහෙත් තවත් මැතිවරනයක් වඩා ස්ථාවර පාර්ලිමේන්තු තන්ත්‍රයක් නිර්මානය කරන බවට සහතිකයක් නැත. පාලක ප්‍රභූව ඔවුන්ගේ න්‍යාය පත්‍රය බලාත්මක කිරීම සඳහා වඩ වඩාත් පාර්ලිමේන්තුවට පරිබාහිර ක්‍රම වෙත හැරෙන්නේ ඒ නිසා ය.

බලගතු සංගත අවශ්‍යතාවල අන පරිදි හා ඇමරිකානු රහස් තොරතුරු අංශවල ඍජු අනුබලය සහිතව නො වේ නම් ඒවායේ සහයෝගය හා අනුදැනුම ඇතිව, ලේබර් පාක්ෂික කාර්යධරයන් රඟදක්වන ලද රඩ්ට එරෙහි කුමන්ත්‍රනය, මේ දිශාව ඔස්සේ තැබූ පලමු පියවර යි. තවත් ඒවා ඊට පසුව පැමිනෙනු ඇත.

පාලක පන්තියට පැරනි මාවතේ ඉදිරියට යා නො හැකිවාක් මෙන් ම කම්කරු පන්තියට ද එසේ කල නො හැක.

අගෝස්තු 21 මැතිවරනය, සාමාන්‍ය වැඩ කරන ජනයාට සහ තරුනයන්ට සිය අවශ්‍යතා පාර්ලිමේන්තු පද්ධතිය හරහා ඉදිරියට ගෙනයා නො හැකි වීම මගින් නිර්මානය කරන ලද තියුනු දේශපාලන අස්ථාවරභාවය හෙලි දරවු කර ඇති සිදුවීම් මාලාවක නවතම එක යි.

හෝක්-කීටිං ලේබර් ආන්ඩු විසින් ගෙනයන ලද "ආර්ථික ප්‍රතිසංස්කරන" න්‍යාය පත්‍රයට සහ රැකියා සිය දහස් ගනනක් විනාශ කිරීමට එරෙහිව පැවති ගැඹුරු විරුද්ධත්වය මධ්‍යයේ, 1996 මාර්තු මස පැවති මැතිවරනයේ දී ලේබර් පක්ෂයට එරෙහි යෝධ රැල්ලක්, සියල්ලටත් වඩා කම්කරු පන්තික මැතිවරන කොට්ඨාශ තුල, දැක ගතහැකි විය.

ඊට යන්තම් වසර තුනකටත් අඩු කාලයකට පසු 1998 දී, හොවාඩ් ආන්ඩුව මහජනයාගේ සමස්ත ඡන්දයම අහිමි කරගත් අතර එයට, ආසන බහුතරය ලබාදුන් පාර්ලිමේන්තු ක්‍රමයේ ප්‍රයෝග නො වන්නට පලමු වාරයෙන් පසුව ම ආන්ඩු බලය අහිමි වන්නට ඉඩ තිබින.

2001 දී යලිවතාවක් සහාග ආන්ඩුව මැතිවරන පරාජයක් කරා ඇදෙමින් සිටි අතර එහි දී එය ටැම්පා සරනාගත "අර්බුදය" නිපදවා ඉන්පසු තම යලි තේරීපත්වීම සඳහා සැප්තැම්බර් 11 ත්‍රස්ත ප්‍රහාර ගසා කෑවේ ය.

2004 වසරේ දී ලේබර් පක්ෂයේ ප්‍රාථමික ඡන්ද පදනම 1931න් මෙපිට පහලම තත්වයට ඇදවැටෙද්දී හොවාඩ්, ධනාත්මක ඡන්ද පදනමක් අත් වින්දේ ය. ප්‍රතිඵලය වශයෙන්, 1970 ගනන්වල අවසාන් භාගයෙන් පසුව ප්‍රථම වතාවට ආන්ඩුවට සෙනේට් සභාවේ බහුතරයක් ලබාදුන්නේ ය. එහෙත් සිය බහුතරය, දරුනු වර්ක්චොයිසස් (වැඩ තෝරාගැනීමේ) කාර්මික නීතියක් සම්මත කර ගැනීම සඳහා උපයෝගී කර ගැනීමට හොවාඩ් උත්සාහ දැරුවිට, ප්‍රධාන පසුබෑමක් පමනක් නිර්මානය කලේ, 2007 නොවැම්බරයේ දී එහි පරාජයට මූලික දායකත්වය සපයමිනි. සැලකිය යුතු බහුතරයක් සමගින් රඩ්ගේ ලේබර් පක්ෂය බලයට පැමිනියේ ය.

දැන් වසර තුනකටත් අඩුකාලයක් තුල ප්‍රධාන පක්ෂ දෙකට ම පවතින විරුද්ධත්වය බහුතරයකින් තොර පාර්ලිමේන්තුවක් නිර්මානය කර ඇත.

මේ සියලු මැතිවරන කරනම්වල පොදු ලක්ෂනය වන්නේ, කම්කරුවන් සිය අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා පලමුව එකකටත් ඉන්පසු අනෙකටත් වසයෙන් ප්‍රධාන පක්ෂ දෙකටම දඬුවම් කිරීමට දරන උත්සාහය යි. ඒ අතරම සමස්ත නිල දේශපාලන සංස්ථාපිතයේ ම කුනුවීම පෙන්නුම් කරන්නේ ස්වාධීන අපේක්ෂකයන්ගේ නැගීම හා හරිතයන්ගේ වර්ධනය යි.

2010 දී ලේබර් පක්ෂයට එරෙහි මාරුව විශේෂයෙන් ම විරැකියාව ඉහල මට්ටම්වල පවතින ක්වීන්ස්ලන්තයේ සහ නිව් සවුත් වේල්ස් හි කම්කරු පන්තික මැතිවරන කොට්ඨාශවල ඉහලින් ම දක්නට

ලැබිනි. මෙම ප්‍රදේශ තුල අනියම් ආකාරයෙන් පලවූ දැඩි විරුද්ධත්වයක් ද සලකුනු කෙරින.

ඒ සමග ම, විශේෂයෙන් දේශගුනික විපර්යාස පිලිබඳව පියවර ගැනීමට ලේබර් පක්ෂය දැක්වූ අසමත්කම මුල්කරගෙන එය කෙරෙහි පවත්නා විරුද්ධත්වය, හරිතයන්ට වාර්තාගත ලෙස ඡන්ද ලැබීම ලෙස ප්‍රකාශ විය. 1998 දී හරිතයන්, නියෝජිත සභාවට ඡන්ද සියයට 2.6ක් සහ සෙනෙට් සභාවට ඡන්ද සියයට 2.7ක් ලබාගත් අතර මෙවර මැතිවරනයේ දී එම සංඛ්‍යා පිලිවෙලින් සියයට 11.4ක් සහ සියයට 13ක් විය.

එහෙත් හරිතයන්ට ඡන්දය දීමෙන්, ලේබර් සහ ලිබරල් පක්ෂ අතර පැද්දීම හා අනියම් විරුද්ධත්වයක් පලවීම හැරෙන්නට වෙනත් ඉදිරි මාවතක් සම්පාදනය කරන්නේ නැත. සෙනෙට් සභාවේ බලතුලනය සමගින් හරිතයෝ අවධරනය කර ඇත්තේ, ඔවුන්ගේ ප්‍රධාන සැලකිල්ල පවත්නේ "ස්ථාවර භාවය" එනම්, ආන්ඩුව තනන ප්‍රධාන පක්ෂ දෙකෙන් කවරක හෝ න්‍යාය පත්‍රයට සහයෝගය දීම බවයි.

දැන් එලැඹී ඇත්තේ ශේෂ පත්‍රයක් සකසා ගැනීමේ කාලය යි. කම්කරු පන්තිය මුහුන දී සිටින දැවෙන ප්‍රශ්න වලට පාර්ලිමේන්තු පද්ධතියේ ආකෘතිය තුල විසඳුම් ඇත්තේ නැත. ඇත්ත වසයෙන් ම පද්ධතියේ අර්බුදය පැනනගින්නේම සමාජයේ ආර්ථික පදනම්වල ප්‍රගාඪ වෙනස්කම්වලින් වන අතර එය කම්කරු පන්තිය සඳහා නව දිශානතියක් ඉල්ලා සිටියි.

නිෂ්පාදනයේ භූගෝලීයකරනයත්, සෑම ජාතික ආර්ථිකයක්ම මත වෙන කවරදාටත් වඩා ගෝලීය මූල්‍ය වෙලඳපොලවල් දරන ආධිපත්‍යයත්, ඒ හෝ මේ ආන්ඩුව මත පීඩනය යෙදූ ප්‍රතිසංස්කරන දිනාගැනීමේ පැරනි වැඩපිලිවෙලේ බිඳවැටීමට කොන්දේසි සකසා ඇත. සෑම ජාතික ආන්ඩුවක ම පිලිවෙත් තීන්දු කරන්නේ මහජන ඡන්දයෙන් නොව, බලගතු ගෝලීය මූල්‍ය හා සංගත ප්‍රභූ පැලැන්තියේ අවශ්‍යතා මඟිනි.

මෙම ක්‍රියාදාමයන්ගේ බලපෑම වර්තමාන පාර්ලිමේන්තු අර්බුදය තුල සෘජු ප්‍රකාශනය අත්කර ගනී. සිය ඡන්දයෙන් බලයට එන්නේ කවුරුන් ද යන්න තීරනය කරන ග්‍රාමීය ස්වාධීන අපේක්ෂකයන් තිදෙනා, ගෝලීය මූල්‍ය වංශාධිපතීන්ගේ "නිදහස් වෙලඳපොල" පිලිගැනීම නිසා ජාතික පක්ෂයෙන් ඉවත් වූවන් ය. වඩා වැඩි ජාතික ආර්ථික පරිපාලනයක් යලි හඳුන්වා දීමට ඔවුන් දරන උත්සාහය විරෝධතා ඡන්ද හෝ හරිතයන්ට ඡන්දය දීම මෙන් ම නිසැකවම අසාර්ථක වනු ඇත.

කම්කරු පන්තිය විසිඵක්වන සියවසේ ආර්ථික හා දේශපාලනික යථාර්ථයන් පිලිබිඹු කරන නව මාවතක් සකසාගත යුතු ය. සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) මැතිවරන උද්ඝෝෂනයේ අක්ෂය වූයේ මෙම නව දිශානතිය යි. ගෝලීය ආර්ථිකයේ සිදු වී ඇති යෝධ වෙනස්කම් මගින් පාර්ලිමේන්තුව හරහා ප්‍රතිසංස්කරන දිනාගැනීමේ ප්‍රතිසංස්කරනවාදී ඉදිරි දර්ශනය කුඩු පට්ටම්වී ඇති බවත්, කම්කරු පන්තිය සමාජවාදී හා ජාත්‍යන්තරවාදී වැඩපිලිවෙලක් මත පදනම් ව තමන්ගේ ම ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් වර්ධනය කරගත යුතු බවත්, අපි අවධාරනය කලෙමු.

මැතිවරන ප්‍රතිඵලය තුල පිලිබිඹු වූ කෝපය, ඉච්ඡා භංගය හා දහනශීලීත්වය, ප්‍රගාඪ සමාජ හා දේශපාලන යථාර්ථයන් ප්‍රකාශයට පත් කරයි. ලේබර් පක්ෂය සහ වෘත්තීය සමිති පාලක ප්‍රභූන්ගේ විවෘත උපකරන බවට පත්වීමේ අර්ථය වන්නේ කම්කරුවන්ට සටන් කිරීම සඳහා සංවිධාන නොමැති බව යි. සමාජ ප්‍රශ්නවලට තනිපුද්ගල විසඳුම් සෙවීමේ පලරහිත ව්‍යායාමයන්හි නිමග්න වීමට ඔවුන්ට බලකෙරී ඇත. මෙම අර්බුදය විසඳිය හැකි එකම මාවත, කම්කරු පන්තියේ නව මහජන පක්ෂයක් ගොඩනැගීම යි.

කුනුවෙමින් පවතින පාර්ලිමේන්තු ක්‍රමය හරහා කම්කරු පන්තියට ඉදිරි මාවතක් නැත. ඇත්ත වසයෙන් ම කම්කරුවන් එම ක්‍රමයේ උගුලට හසුව සිටින්නේ යම්තාක් කල් ද ඒ තාක් කල් ඔවුන්, තිරයට පිටුපසින් සූදානම් කෙරෙන, පාර්ලිමේන්තු ක්‍රමයෙන් පිටස්තර නව පියවරයන් කෙරෙහි නිරායුධ වනු ඇත.

එහි වැඩි වූ ඡන්ද සංඛ්‍යාව මගින් පෙන්නුම් කරන පරිදි සසප, මෙම මැතිවරන උද්ඝෝෂනයේ දී වැදගත් සහයෝගයක් දිනා ගත්තේ ය. වඩාත් වැදගත් වන්නේ දහස් ගනන් කම්කරුවන්, ශිෂ්‍යයන් සහ තරුනයන් පක්ෂයේ විශ්ලේෂනය සහ ක්‍රියාමාර්ගය කෙරෙහි උනන්දුවක් දැක්වීම යි. සසපයේ උද්ඝෝෂනයට සහයෝගය දැක්වූ සියලු දෙනාගෙන් අප ඉල්ලා සිටින්නේ එහි මූලධර්මාත්මක ඉදිරිදර්ශනයට ගැඹුරු අවධානයක් දෙමින් එයට සම්බන්ධ වී කම්කරු පන්තියේ නව විප්ලවවාදී පක්ෂය ලෙස සසප ගොඩනැගීමේ කර්තව්‍යය අතට ගන්නා ලෙස යි.

සමාජවාදී සමානතා පක්ෂය (ඕස්ට්‍රේලියාව)

© www.wsws.org